විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
வெளிநாட்டு வளங்கள் திணைக்களம்
Department of External Resources

මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3 වැනි මහල), තැ.පෙ. 277, කොළඹ 00100, ශ්‍රී ලංකාව
நிதி அமைச்சு
செயலகம் (3 ஆம் மாடி), த. பெ. இல. 277, கொழும்பு 00100, இலங்கை
Ministry of Finance
The Secretariat (3rd Floor), P.O. Box 277, Colombo 00100, Sri Lanka

Web Site:www.erd.gov.lk
e-mail: info@erd.gov.lk

මගේ අංකය / எனது இல / My No: SC&PMU/Grant/19

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2019.07.25

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරු

මහත්මයාණනි/මහත්මියණි

**ශ්‍රී ලංකාව වෙත වෙනත් රාජ්‍යයන්/ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්/ විදේශ ආයතන විසින් ලබාදෙනු ලබන විදේශ ප්‍රදානයන් (Grants) හා ශිල්පීය ආධාර (Technical Assistance) ලබාගැනීම හා ඒවා නිසි පරිදි ගිණුම් ගතකිරීම**

ශ්‍රී ලංකා රජය වෙත වෙනත් රාජ්‍යයන්, විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා විදේශ ආයතන විසින් ලබාදෙනු ලබන විදේශ ප්‍රදානයන් සහ ශිල්පීය ආධාර නිසි ක්‍රමවේදයෙන් බැහැරව විවිධ අමාත්‍යාශ, දෙපාර්තමේන්තු හා ආයතන විසින් ලබාගන්නා බවට තොරතුරු ලැබී ඇති අතර, එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විගණනයේදී මෙම කරුණු නොයෙක්විට අනාවරණය වී ඇත.

02. විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර (විදේශ ශිෂ්‍යත්ව ආදිය) නිවැරදි යාන්ත්‍රණය හරහා ලබා නොගැනීම හේතුවෙන් එම අරමුදල් සහ ඒවායේ දරනු ලබන වැය සහ ප්‍රතිලාභ නිසි පරිදි ශ්‍රී ලංකා ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොවීම පිළිබඳව දැඩි අවධානය යොමු කරන ලෙස ජනරජ ගිණුමට අදාළව ඉදිරිපත් වූ විගණන නිරීක්ෂණ මඟින්ද අවධාරණය කර ඇත.

03. එබැවින් ශ්‍රී ලංකා රජය වෙත ලබාදෙන සියලුම විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාව මත ලබාගත යුතු අතර, එසේ ලබාගැනීමේදී ඊට අදාළව මුදල් රෙගුලාසි පරිච්ඡේද 11හි ඡේද 610 සිට 626 දක්වා වූ උපදෙස් මෙන්ම 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 මඟින් ලබාදී ඇති උපදෙස්ද තරයේ පිළිපදින ලෙස කාරුණිකව දැනුම් දෙමි.

04. එමෙන්ම විදේශ ප්‍රදාන මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සඳහා අවශ්‍ය සම්පත් සපයා ගැනීම පිළිබඳව පැහැදිලි සැලැස්මක් අදාළ රේඛීය අමාත්‍යාංශයට, දෙපාර්තමේන්තුවට

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 94-11-2484693
කාර්යාලය / அலுவலகம் / Office: 94-11-2484500, 94-11-2484600
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax: 94-11-2447633, 94-11-2387153, 94-11-2434876

හෝ ආයතනයට තිබිය යුතු අතර, ඒ සඳහා දේශීය ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නම් භාණ්ඩාගාරය සමඟ කලින් සාකච්ඡා කර මධ්‍යකාලීන අයවැය රාමුව තුළ එම ප්‍රතිපාදන ඇතුළත් කර ගැනීමට එම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ ආයතන කටයුතු කළ යුතුවේ.

05. විදේශ ප්‍රදාන ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීමේදී මෙම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත එම ප්‍රතිපාදන ලබාගෙන තිබේද යන්න පිළිබඳව විමසා බලන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දැනටමත් දන්වා ඇති බැවින් ඉදිරියේදී විදේශ ප්‍රදානයන් සඳහා අයවැය ප්‍රතිපාදන ලබාගැනීමේදී මෙම දෙපාර්තමේන්තුවේ එකඟතාවය අනිවාර්ය වනු ඇත.

06. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතාමත් අගය කොට සලකමි.

මෙයට - විශ්වාසී

ප්‍රියන්ත රත්නායක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :
1. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
9. ප්‍රධාන මූල්‍ය නිලධාරී, මුදල් අමාත්‍යාංශය
10. සහකාර විගණකාධිපති, සහකාර විගණකාධිපති කාර්යාලය, මහා භාණ්ඩාගාරය